ව්ලද්මීර් ස්තෙපානෆ්



# මායාකාරිය සහ දරුෂ්කා

රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න

එකෝමත් එක කාලයක එක් වෙළෙන්දෙක් හිටියා. එයාගේ බිරිඳ මිය ගියා. ඒ ගැන ශෝක වෙලා ශෝක වෙලා අන්තිමේදී එයා වෙනත් විවාහයක් කර ගත්තා. අලුත් බිරිඳ ගෙදරට කැන්දාගෙන විත් දුවට කතා කළා.

“දරූෂ්කා දුවේ, මෙච්චර කාලයක් අපි දෙන්නා තනියෙන් නොවැ ජීවත් වුණේ. ඕං දැන් ඉතින් අපි තුන් දෙනයි.”

එක දවසක් වෙළෙන්දා බඩු ගේන්න ඈත නගරයකට ගියා. දරූෂ්කායි කුඩම්මයි ගෙදර තනි වුණා.



රෑ බෝ වුණා. දරුෂ්කා නිදා ගන්න සූදානම් වෙන කොටම කිකිළි දුවගෙන ආවා.

"දරූෂ්කා අද ඇඳේ නිදාගන්න එපා. පෙට්ටගම ඇතුළෙ නිදා ගන්න. මං ඇඳ උඩ නිදා ගන්නම්." කිකිළි කීවා.





දරූෂ්කා පෙට්ටගම ඇතුළෙ හැංගිලා බලා හිටියා. වැඩි වෙලාවක් ගියේ නෑ. කාමරයේ දොර ඇරුණා. කුඩම්මා කාමරයට ඇතුළු වුණා. කුඩම්මා ඇඟිල්ලට රත්තරන් මුද්දක් දා ගත්තා විතරයි, ඈ මායාකාරියක් බවට පත් වුණා.

බාබා යාගා කියන්නේ ඒ නපුරු මායාකාරියට.

බාබා-යාගා දරූෂ්කාව කන්න හිතාගෙන ඇඳට එබිකම් කරලා බැලුවා. ඒත් ඇඳේ හිටියෙ කිකිළියක්. කිකිළි තටු ගහලා මහා හයියෙන් කෙකර ගාලා මායාකාරිට කොටාගෙන කොටාගෙන ගියා. බාබා යාගා බයේ පැනලා දිව්වා.



පසුදා උදේ දරුෂ්කා පිටි හල හලා ඉන්න කොට කුඩම්මා ඇවිත් කතා කළා.

"දරුෂ්කා, කාවද උඹ ඊයේ රෑ හීනෙන් දැක්කෙ?"

"රතු කිකිළියක්"

"මගේ රත්තරන් මුද්ද එහෙම දැක්කෙ නැද්ද?"

"නෑ, දැක්කෙ නෑ."




දෙවෙනි දවසටත් රෑ වුණා. දරුෂ්කා නිදාගන්න සූදානම් වෙන කොටම බැටළු පැටියෙක් දුවගෙන ආවා.

“දරුෂ්කා අද පෙට්ටගමේ නිදාගන්න එපා. බංකුව උඩ නිදා ගන්න. මං පෙට්ටගමේ නිදා ගන්නම්.” බැටළු පැටියා කීවා.





දරුෂ්කා බංකුවේ නිදාගෙන ඊළඟට මොනවද වෙන්නෙ කියලා බලාගෙන හිටියා. දොර ඇරුණා. කුඩම්මා කාමරයට ඇතුළු වුණා. කුඩම්මා ඇඟිල්ලට රත්තරන් මුද්ද දමාගෙන බාබා-යාගා වුණා. දරුෂ්කා කන්න හිතාගෙන පෙට්ටගමට එබුණා. ඒත් පෙට්ටගමේ හිටියේ දරුෂ්කා නොවෙයි. බැටළු පැටියා. මහා හයියෙන් කෑ ගහපු බැටළු පැටියා කුරවලින් ගහලා බාබා-යාගා මායාකාරිව එළවා දැම්මා.





පසුදා උදෑසන දරුෂ්කා නූල් කටිමින් ඉන්න වෙලාවෙ කුඩම්මා ආවා.

"දරුෂ්කා උඹ ඊයේ රෑ හීනෙන් දැක්කෙ කවුද?"

"ලොම් පොකුටු බැටළු පැටියා"

"මගේ රත්තරන් මුද්ද එහෙම දැක්කෙ නැද්ද?"

"නෑ, දැක්කෙ නෑ."

තුන්වෙනි දවසටත් රෑ වුණා. දරුෂ්කා නිදාගන්න සූදානම් වෙන කොටම බල්ලා දුවගෙන ආවා.

"දරුෂ්කා බංකුවේ නිදාගන්න එපා. බිත්තිය අයිනේ පැදුරේ නිදා ගන්න. මං බංකුවේ නිදා ගන්නම්"



දරුෂ්කා බිත්තිය අයිනේ පැදුරක වැතිරිලා මොනවද වෙන්නෙ කියලා බලාගෙන හිටියා.

කාමරයේ දොර ඇරුණා. කුඩම්මා ඇතුළු වුණා. ඇය රත්තරන් මුද්ද ඇඟිල්ලෙ දා ගෙන බාබා-යාගා මායාකාරී බවට පත් වුණා.



බාබා-යාගා දරුෂ්කාව කන්න හිතාගෙන බංකුවට එබුණා. ඒත් බංකුවේ හිටියේ දරුෂ්කා නෙවෙයි. බල්ලෙක්. මහා හයියෙන් බුරපු බල්ලා බාබා-යාගා මායාකාරිව හපා කන්න පටන් ගත්තා. මායාකාරි බයේ පැනලා දිව්වා. ඈගේ රත්තරන් මුද්ද ඇඟිල්ලෙන් ගැලවිලා බිත්තිය ළඟ නිදාගෙන සිටි දරුෂ්කා අතටම පෙරළිලා ගියා.



පසුදා උදෑසන දරුෂ්කා ළිප මොලවන අතරේ කුඩම්මා ඇවිල්ලා ප්‍රශ්න කරනවා.

"දරුෂ්කා උඹ ඊයේ රෑ කාවද හීනෙන් දැක්කෙ?"

"බූල් බල්ලා"

"එතකොට මගේ රත්තරන් මුද්ද එහෙම දැක්කෙ නැද්ද?"

"දැක්කා, මේ තියෙන්නෙ ඒක."



එහෙම කියන ගමන්ම දරුෂ්කා මුද්ද ළිපට විසි කළා. යටිගිරියෙන් කෑ ගහපු බාබා-යාගා මුද්ද ගන්න ළිපට නැමුණා. මුද්ද ගන්න ඈට බැරි වුණා. ඈ පිච්චිලා අළුවෙලා ගියා. ළිපෙන් කළුපාට දුමක් පිට වුණා. එච්චරයි.



ව්ලද්මීර් ස්තෙපානෆ්

# මායාකාරිය සහ දරුෂ්කා

රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න



Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-955-591-255-6

9 789555 912556

මිල රු. 150.00

කුරුලු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/071-8263828